# විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

ආයතන චක්‍රලේඛ ලිපි අංක: 05/2018

අංක 20, වෝඩ් පෙදෙස
කොළඹ 07

2018 අප්‍රියෙල් මස 02 දින

විශ්වවිද්‍යාල උපකුලපතිවරුන්
මණ්ඩපාධිපතිවරුන්
ආයතන අධ්‍යක්ෂවරුන්

<u>බඳවා ගැනීමේ කාර්යය සඳහා සෑම තේරීම් කමිටුවක් සඳහාම ලකුණු ලබා දීමේ පරිපාටිය</u>

ඇතැම් උසස් අධ්‍යාපන ආයතන / ආයතනවල යෝග්‍ය පුද්ගලයින්ට පත්වීම් ලබා දීමට නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා පිහිටුවා ඇති තේරීම් කමිටු අනුමත ලකුණු ලබා දීමේ පරිපාටියක් මත පදනම්ව අපේක්ෂකයින් ඇගයීමට ලක් කිරීමකින් තොරව ඔවුන්ගේ නිර්දේශ ඉදිරිපත් කරන බවට 2017.10.27 දින පැවති සිය 974වන සභා වාරයේ දී කොමිෂන් සභාවේ අවධානයට ලක් විය.

2. එබැවින්, විශ්වවිද්‍යාල පද්ධතියේ සියලු පත්වීම් සඳහා බඳවා ගැනීමේ දී පාලන අධිකාරිය මඟින් අනුමත කරනු ලැබූ ලකුණු ලබා දීමේ පරිපාටි මත පදනම් වූ ලකුණු පත්‍රිකා ( Mark Sheet) භාවිත කරන මෙන් උසස් අධ්‍යාපන ආයතන / ආයතන වෙත දැනුම් දෙනු ලැබේ.

3. සෑම තනතුරක් සඳහාම නිසි පරිදි සැලසුම් කරන ලද ලකුණු ලබා දීමේ පරිපාටියක් සඳහා පාලක අධිකාරියේ අනුමැතිය එම තනතුර සඳහා සම්මුඛ පරීක්ෂණය පැවැත්වීමට පෙර ලබා ගත යුතුව ඇත.

4. කරුණාකර ඒ අනුව කටයුතු කරන්න.

**අත්. කළේ / මහාචාර්ය මොහාන් ද සිල්වා**
සභාපති

පිටපත්:
1. ලේකම් / උසස් අධ්‍යාපන සහ මහාමාර්ග අමාත්‍යාංශය
2. සභාපති කාර්යාලය / විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
3. උප සභාපති / විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
4. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සාමාජිකයන්
5. ලේකම් / විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
6. පීඨාධිපතිවරුන්
7. විශ්වවිද්‍යාල ලේඛකාධිකාරිවරුන්
8. ගණකාධිකාරී / විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
9. විශ්වවිද්‍යාල මූල්‍යාධිකාරීවරුන්
10. උසස් අධ්‍යාපන ආයතන/ ආයතනවල පුස්තකාලයාධිපතිවරුන්/ ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපතිවරුන් / සහකාර පුස්තකාලයාධිපතිවරුන්
11. මණ්ඩප/ ආයතනවල නියෝජ්‍ය ලේඛකාධිකාරිවරුන් / ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරිවරුන් / සහකාර ලේඛකාධිකාරිවරුන්
12. මණ්ඩප/ ආයතනවල නියෝජ්‍ය මූල්‍යාධිකාරීවරුන් / ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරීවරුන් / සහකාර මූල්‍යාධිකාරීවරුන්
13. අභ්‍යන්තර විගණක / විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
14. විශ්වවිද්‍යාලවල රජයේ විගණක අධිකාරිවරුන්
15. උසස් අධ්‍යාපන ආයතනවල නියෝජ්‍ය අභ්‍යන්තර විගණකවරුන් /ජ්‍යෙෂ්ඨ සහකාර අභ්‍යන්තර විගණකවරුන් / සහකාර අභ්‍යන්තර විගණකවරුන්
16. වෘත්තීය සමිති ලේකම්වරුන්
17. විගණකාධිපති

යූජීසී/එච්ආර්/2/3/85

ටී/-